# සිංහල සංගීතය

## ඩබ්ලිව්. බී. මකුලොලුව

සෑම දෙයක් ම ඉටුකර ගැනීමට අවශ්‍ය වනුයේ ඕනෑකමයි. සෑම පහසුවක් ම ඇතත් ඕනෑකම නැත්නම් අභිමතාර්ථය ඉටු නොවේ. ඕනෑකම ඇති වූ විට නැති පහසුකම් ඇති වේ. බැරිකම් මහ හැරේ. මග ද ඉබේම හෙළිවේ. අපහසුකම් අවහිරකම් අබිබවා නො පසුබටව අභිමතාර්ථය ඉෂ්ට කර ගැනීමය මිනිස් කම. මිනිහා තිරිසනාගෙන් කැපී පෙනෙනුයේ එවිට ය.

සිංහලයාට සිංහලයී කියහැකි සංගීතයක් අවශ්‍ය ද යනු පළමුවෙන් තීරණය කරගත යුත්තකි. ජාතියක් වශයෙන් පෙනී සිටින ඕනෑම මනුෂ්‍ය වර්ගයකට ඒ ජාතියට අයත් සියුම් කලා ඇති විය යුතු බව ලෝකය පිළිගත් කාරණයකි. ලෝකයේ දියුණු හෝ නො දියුණු යයි සැලකෙන සෑම ජාතියකට ම ඒ ඒ ජාතියට ආවේනික වූ සියුම් කලා, විශේෂයෙන් සංගීත ක්‍රම ඇති බව පෙනේ. එකිනෙකට යා බදව පිහිටි ජර්මනිය, හංගේරියාව, රුමේනියාව, චෙකොස්ලොවෙකියාව ආදි රටවල පවත්නා සංගීත පද්ධතිය මූලික වශයෙන් එකක් වුව ද ඒ ඒ ජාතියට සීමා වූ ඒ එකම සංගීත පද්ධතියේ නා නා විකාශන වේ. මේ මුහුණුවර ලැබෙනුයේ ඔවුනොවුන්ට ආවේනික වූ ජන සංගීතවල බල පැමෙනි. සියම්, බුරුමය, කාම්බෝජය, චීනය, කොරියාව ආදි රටවල පවතින සංගීතය පිළිබඳව ද කිය යුත්තේ මෙය ම ය. මහ සයුරෙන් වට වූ සිංහල රටෙහි පමණක් සිංහලයාට ආවේනික වූ සංගීතයක් නැති වීමට හේතුවක් නැත.

ඇතැමුන් සිංහලයාට සංගීතයක් නැතැයි කියතත් අප ගැමියා එය නො පිළිගනී. තත්වඥයෝ ද නො පිළිගනිති. අප ගැමියාගේ සංගීතය තවමත් පැරණි ජනකවි ම ය. පැරණි වැයුම ය. පැරණි නැටුම ය. මෙය ද ඉන්දියානු සංගීතයම යයි සමහරු කියති. පෙර අපර දෙදිගට ම විහිදී ගිය භාරතීය සංස්කෘතයෙහි ආභාෂය සිංහල ද්වීපයට ද බල පෑ බව කිය යුතු ය. භාරතීය ලක්ෂණ සිංහල ජන සංගීතයෙහි ද ඇති වීම පුදුමයක් නො වේ. වංගයකු හෝ ද්‍රවිඩයකු සේ පෙනුණ ද සිංහලයා වංගයෙක් හෝ ද්‍රවිඩයෙක් නොවේ. සිංහලයෙකි. වංග, හින්දි හෝ දෙමළ භාෂා ලක්ෂණ ඇතත් සිංහල භාෂාව ඒ එකම භාෂාවක්වත් නො වේ. සිංහලම ය. සිංහල ගැමි සංගීතයේ ද ඉන්දියානු සංගීතයේ මුහුණු වර ඇතත් එය ඉන්දියානු නො වේ. සිංහල ම ය.

අප රටට ද ආවේනික වූ සංගීත ක්‍රමයක් ඇති බව සුපරීක්ෂාවෙන් බලන්නෙකුට වැටහී යා යුතු ය. දියුණු ඉන්දියානු හා වෙනත් විදේශීය සංගීත ක්‍රමවලින් සිංහල සංගීතය නො පෙනෙන තරමට යට වී වැසී ගොස් ඇති බව කිය යුත්තකි. සිංහල සංගීතයක් අවශ්‍යය යන උද්ඝෝෂණය විසි වයක් පමණ පැරණි ය. එහෙත් විදේශීය සංගීතවල බල පැමෙන් ඒ ඕනෑකම තවම ඉටු වූ බවක් නො පෙනේ. සිංහල සංගීතය සකස් කළ යුත්තේ සිංහල සංගීතඥයන් විසින්ම ය. දියුණු විදේශීය සංගීතයම අගය කරමින්, ආරක්ෂා කරමින්, හා ප්‍රචාරය කරමින් කල දවස ගෙවීමෙන් සිංහල සංගීතයක් ඇති නො වේ. වනුයේ විදේශීය සංගීත ක්‍රමවලට යටවී ජීවත් වීමට තතනන සිංහල සංගීතයේ මූල ධාතුව වශයෙන් සැලකිය හැකි දේශීය ගායනා රීති නැත්තට ම නැති වී යාම ය.

ලෝකයේ සෑම රටක ම ඒ ඒ සංගීත ක්‍රම සකස් වූයේ පද්‍ය ගායනය මුල්කොට ගෙන ය. පළමුවෙන් පැදි පැබැඳුණේත් ඒ පැදි ගයන ලද්දේත් නොයෙකුත් පුද පූජා හා ඇදහීම් සඳහා ය. මේ ගායන ක්‍රමය භක්ති ගීත නමින් හැඳින් වේ. සමාජයේ වෙනත් නොයෙක් උත්සව හා ජීවන වෘත්තීන් සඳහා ද ඒ ඒ කාර්යයට සුදුසු පරිදි සකස් කොටගත් ගී ගයන ලදී. ගැමි ගී

වාදනයෙන් සැදුම්ලත් මේ ගායනා ද, මල් පූජා සඳහා යොදන භක්ති ගීත ද ජන ව්‍යවහාරයෙහි එන ගැයුම් ද සංකලනය වීමෙන් ඒ ඒ ප්‍රදේශයන්ගේ සංගීත ක්‍රම හැදී වැඩී ගියේ ය.

''ප්‍රබන්ධ නමැති ගායනා විසිදී ගීය පද්‍ය නාදමාලාවන්ගින් යුතුව පූජනීය ස්ථානවල ගයන ලද ගීතයට ගැළපෙන පද නාදමාලාවන් ක්‍රමයෙන් වී ගායනයක් බවට පත්විය. රජ වාසලේ ගයන ලද 'ගාන්ධර්ව' නම් ගීත ශෛලිය ජනප්‍රිය ගැමිගායනයෙන් ඇති වූවකි.

''ශෝරිජන්ගේ ද්‍රවිඩ භාෂාවෙහි එන දෙවියන්ගේ හා වීරයන්ගේ වික්‍රම ගැප්කොට ගත් පද පවන පදද නොවළ නාට්‍යපයන් විසින් ගයන ලදී.

''ආනිලෝත්සවයේ ගැයූ ගී පාලිය ආශ්‍රයෙන් ලියූමෙන් ගැමි ගී වලිනි.

''ගැදී වීමින් ක්‍රමය විවිධ වූ විවිධ නිබන්ධන ඇතිවීමට හේතු වූයේ විය. ඒ නිබන්ධන ශුද්ධ ප්‍රබන්ධ ගැයීමෙන් විද්‍යාව පිළිබඳ උත්තානිය ද ඇති විය.

''වෛදික ගායනය එකී ගායන සම්ප්‍රදාය නිසා ක්‍රමක්‍රමයෙන් පූජක පක්ෂයට පමණක් සීමා වී ගෙයක්ගොට ගිය නියය විය. එහෙයින් ජන සංගීතය ජනප්‍රිය විය. එවකට සිටි ශාස්ත්‍රඥයෝ ශිෂ්ට සමාජයේ රුචියට සරිලන පරිදි ජන සංගීතය සංශෝධනය කොට විධිමත් කර ගත්හ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජන සංගීතය මාර්ග සංගීතය බවට පත්විය.'' දැන් පවත්නා හින්දුස්-තානි සංගීතයේ අතීතය මෙය වේ. සිංහල සංගීතයේ ද පදනම විය යුත්තේ සිංහල පදය ගායනය ම ය.

අපට ආවේණිකව එන සිංහල ගැයුම් රසවත් ය. සිංහල වැයුම්, විශේෂයෙන් ම බෙර වැයුම් දියුණු ය. ක්‍රමවත් ය. සිංහල නැටුම් ද දියුණු ය. ක්‍රමවත් ය. සංගීතයක් හැදී වැඩීමට අවශ්‍ය අංගෝපාංගවලින් ඒ ගැයුම් ක්‍රම සමන්විත බව ඒවා පරිශීලනය කළ අය මැනවින් දනිති. සිංහල ගායනයෙහි රස නොදැනෙන්නේ ඒ සියල්ල පිළිබඳ පිළිකුලක් පර දෑයෙහිම ගැති කමත් අවිචාරයත් නිසා විය යුතු ය. විදේශීය දියුණු සංගීත ක්‍රම අගය නො කළයුතු ය, නො ඉගෙන ගත යුතුය යි අපි නොකියමු. තමාගේ සංගීතයක් වුව ද ඉගැනීමත් අගය කිරීමත් යන දෙකම වැදගත් ය. ගත යුතු දේ නොතැකීමෙන් ගෙන සිය දෑයෙහි පෝෂණය පිණිස යෙදවීමය කළ යුත්තේ.

දැනට ඇති සිංහල ගැයුම් ක්‍රම හින්දුස්තානි ගැයුම් ක්‍රම තරම් නො දියුණු වූ. සිංහල ගැයුම් වලින් ශාස්ත්‍රීය යි කිය හැකි සංගීතයක් සකස්කොට ගත නො හැකි වූ. සිංහල ගැමි ගී නාද මාලාවලින් ගැළපෙන ඉන්දියානු ගැමි ගීත් තිබෙත්. හින්දුස්තානි රාග වලින් පිට එන සිංහල ගායනා නැතිලු. සප්ත ස්වරය ම ඇතුළත් කරන සිංහල ගැයුම් නැතිලු. සිංහල ගැයුම් වලින් සකස් කොට ගත හැක්කේ සීමාසහිත ගීත ගණනක් පමණ වූ. සිංහල සංගීතයක් සකස් කර ගැනීමට අළුත් ස්වර සප්තකයක් අවශ්‍ය වූ. එහි ගුණ විධි දෙකකට වඩා තිබිය යුතුලු. සිංහල සංගීතයක් හද ගැනීමට අවශ්‍ය කමක් ද නැති වූ. මේ දක්වන ලද්දේ ඇතැම් සංගීතඥයන්ගේ කියුම් ය. මේවා අපේ වැරිකම වසා ගැනීමට දෙවන දෙසවිලි යි මහජනයා කියති.

සිංහල ගැයුම් හින්දුස්තානි ගැයුම් තරම් දියුණු නම් ඒ දියුණු කිරීමට වෑයම් කළ යුතු නොවේ. උපන්ගෙයි ම ශාස්ත්‍රීය වූ කලාවක් ලොව ම නැත. කල් යත් යත් ව්‍යවහාරයෙන් එය ශාස්ත්‍රීය බවට පත්විම නො වැළැක්විය හැක්කකි. ඉන්දියානු ගැමි ගී වල නාද මාලාවලට සමාන යුරෝපීය ගැමි ගීත් තිබේ. ඒ ගැමි ගී ඉන්දියානුන්ගෙන් යුරෝපීයයන් පැහැරගත් ඒවා හෝ යුරෝපීයයන්ගෙන් ඉන්දියානුන් පැහැර ගත් ඒවා හෝ නොවේ. ඇතැම් ස්වර සංයෝග මුළු ලොවට ම පොදු ය. වෙනස වනුයේ ශෛලියෙහි පමණි. හින්දුස්තානි රාගවල එන සඟ ඉන්දියාවට සීමාවූවක් නොවේ. රාග නාම මාලාව නම් ඔවුන්ගේ ය. ''දකුණු යුරෝපයේ හා පෘතුගාලය ඉතාලිය වැනි රටවලත් ගැමි ගී ගායනයේ දී රාගානුකූල ගායනා තවමත් ඇසිය හැකිය. භූපාලි, භෛරවි භෝජ්වාලි වැනි අපගේ රාග ගණනාවක ම ලක්ෂණ මේ ගැමි ගී වල අපට සොයා ගත හැකි වෙයි.'' යි මහාචාර්ය රත්න්ජංකාර් පඬිතුමා කියයි. භාරතීය සංගීතය පවා සප්තස්වරය මුලින් ම වැළඳ ගෙන නො වේ. ආර්චික, ගාථික, සාමික, හා ස්වරාන්-තරික නොහොත් ඒක ස්වර, ද්විස්වර, ත්‍රි ස්වර හා චතුස්වර ගායනය ක්‍රමක්‍රමයෙන් දියුණු වී සප්ත

1. The Pelican History of Music — Volume 1.
2. The Story of Indian Music by O. Gosvamy.

ස්වරය දක්වා පැතිරෙන්නට දීර්ඝ කාලයක් ගතවිය. සිංහල ගායනය එතරම් දියුණු නොවූ බව එහි මෙහෙවීන් ස්වර පහකට හෝ හයකට ද පැතැළිවිය ස්වර ගනට ම ද තැබීර ගිය ගායුම් ඇත.

උදාහරණ:—

— සම මග රිස රිග රිග රිස ස — සරි රිග ස සරි සගි පධි ධප

S සකි S මෙ ම ළි තව ල S සැපා S සැ ට ත පදි ස

— පධ ස රි සරි සගි ධනි පප — පධ ස රි සග රිග රිස

S රජ ද න මු ට ලො ට S සපු ගි න් ගත් S S S

සිංහල නාද මාලාවලට ගැළපෙන හින්දුස්ථානි රාග අනුසාරයෙන් ගායනා ද ගත හැකිය. එක් එක් නාද මාලා වර්ධනය කිරීමෙන් නම් සීමාසහිත ගීත ගණනකට වඩා ගත හැකි ගායනා ඇති ය. සිංහල සංගීතය සකස් කර ගත යුත්තේ ශාස්ත්‍රීය පදනමක් මත පිහිටා ය. එහිදී සැලකිය යුතු සිංහල ගැයුම් වැයුම් සීමා නොවනු ඇත. ලෝකයේ හැම ස්වර වාදන ක්‍රමයකම මූල ගායන ක්‍රමයකී සප්ත ස්වරය මුළු ලොවට ම පොදු වන්නකි. ශ්‍රැති විහි දෙකක් එහි තුළ ම ඇත. ලෝකයේ සංගීත ක්‍රම එකිනෙකට වෙනස් වන්නේ සප්ත ස්වරයෙන්වත් ශ්‍රැති භේදයෙන්වත් නොව ය. ඒ ඒ ජාතීන්ගේ භාෂාව, ආගම, ජීවන වෘත්තිය, දේශ ගුණය, ගති පැවතුම් ආදී, ජීවිතයට අනුරූප වූ ශෛලීන්ගෙනි.

"වන්නම්, අෂ්ටක, ස්තොත්‍ර, පිරිත්, සිවුපද යන මේවා ලංකාවේ තිබෙන දේශීය සංගීතයයි. නවමත් ඒවායේ පාරම්පරික ස්වරූපයන්ගෙන් පවතින මේ සංගීතය පදනම් කොට ගෙන ඉතා දියුණු සංගීතයක් ගොඩ නැඟිය හැක." හින්දුස්ථානි ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ, ඉන් කෘති කිහිපයක් සැපයූ හින්දුස්ථානි සංගීතයේ දුරන්ධරය හා ප්‍රභවය වැනි කෙනෙකු වූ, මහාචාර්ය රත්න්ජංකර් පඬිතුමා ලංකාවට පැමිණ සිංහල ගැයුම් වැයුම් ගැන ඒ පිළිබඳ, රාජකීය ආසියාතික සංගමයේදී පවත්වන ලද කථාවෙන් උද්ධෘත පාඨයකි ඉහත දක්වන ලද්දේ.

සිංහල සංගීතයක් යාද ගැනීම ගැමි වහරෙහි හා ජන වහරෙහි එන පද්‍ය ගායනය ඇසුරෙන් සකස් කර ගත යුතු බවටත්, කළ හැකි බවටත් මෙයට වඩා සාධක හා සාක්ෂි අනවශ්‍ය ය. ඉන්දීය ශාස්ත්‍රීය සංගීතයේ ප්‍රධාන අංගයක් වන කෘති හා හෝරි ගායන හින්දු භක්තිකයන් විසින් තම දේවාලයන්හි ගයනු ලබන ආගමික ගීත වලින් ද, ධ්‍රැපද, ඛ්‍යාල වැනි ශාස්ත්‍රීය ගායන ශෛලීන් ඉන්දියානු ගැමි ගී වලින් ද, යුරෝපීය සංගීතය ද්‍රවිත්ගේ භක්ති ගී වලින් ද, සකස් කොට ගන්නා ලද්දේ නම් සිංහල ගැමි වහරෙහි හා ජන වහරෙහි එන ගැයුම් වලින් සිංහල සංගීතයක් සකස් කර ගත නො හැකි යයි කවුරු කියත් ද?

සිංහල සංගීතයක් සකස් කර ගැනීමට නම් පාරම්පරික ව පැවත එන සිංහල ගැයුම් ස්වරාභ්‍යාසය ඇතියවුන් විසින් ගැයිය යුතු ය. සිංහල ගැයුම් හඬ නො සුහුඹු ගැමියනට ම සීමා නො කොට සංගීතඥයන් විසින් ප්‍රගුණ කළ යුතු ය. සිංහල නාද මාලා කිසියම් ශාස්ත්‍රීය පදනමක් මත වර්ධනය කටයුතු ය. කාල පරම්පරාව අතර සිංහල ගැයුම් අගය කිරීමටත් ප්‍රගුණ කිරීමටත් මං සැලැස්විය යුතු ය. හින්දුස්ථානි සංගීතය ම උසස් කොට දක්වීමත් එය ප්‍රමාණය ඉක්මවා ප්‍රචාරය කිරීමත් නො කටයුතු ය. එයට රජයෙන් ලැබෙන අනුග්‍රහය සහ වියදම ද සීමාසහිත විය යුතු ය. රජයෙන් සිංහල සංගීතයට විශේෂ වරප්‍රසාද හා සහාය්‍යතාව සැලැස්විය යුතු අතර රජයේ හා රජයේ ආධාර ලබන සංගීතායතනවල සිංහල ගැයුම් ඉගැන්විය යුතු ය. එවිට නුදුරු අනාගතයේ දී සිංහල සංගීතයක් බිහිවනු නි සැක ය.